සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**10 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **14 S I**

**කතෝලික ධර්මය - I** **කාලය පැය එකයි**

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
● අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වල දි ඇති (1),(2),(3),(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
● ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
●එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද කියවා ඒවාද පිළිපදින්න.

01. අපෝස්තුළුවරුන්ගේ සිට පැවති එන ඉගැන්වීම් හා සම්ප්‍රදායන් ප්‍රධාන වශයෙන් අන්තර්ගත වනුයේ,
1. ශුද්ධ බයිබලය තුළ 2. විශ්ව ලේඛන තුළ
3. ජීවන සභා සම්ප්‍රදාය තුළ 4. ජගත් සංදේශ තුළ

02. ඔබදියා හා ශෙපනියා යන ග්‍රන්ථ අයත් වන පැරණි ගිවිසුම් ග්‍රන්ථ කාණ්ඩය වනුයේ,
1. පංච පුස්තකය 2. ඉතිහාස පොත්
3. ප්‍රඥා සාහිත්‍යය 4. දිවැසිවර ග්‍රන්ථ

03. වෘත්තයෙන් වෛද්‍යවරයෙක් හා ඉතිහාසඥයෙක් රචනා කරන ලද නව ගිවිසුම් ග්‍රන්ථය වනුයේ,
1.අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත 2. ජොහාන් සුභාරංචිය
3. කොරෙන්ති. 4. එළිදරව්ව

04. බොරු ගුරුවරුන්ගේ වැරදි ඉගැන්වීම් නිවැරදි කිරීමට පාවුළු තුමා ලියන ලද සංදේශයකි.
1. එපීස 2. කොලොස්සි 3. පිලිප්පි 4. පිලමොන්

05. ශුද්ධ පාවුළු තුමා හැරුණු කොට නව ගිවිසුමේ වැඩිම සංදේශ ගණනක් ලියා ඇති කතුවරයා වනුයේ,
1. ශුද්ධ ලුක් තුමා 2. ශුද්ධ පේදුරු තුමා
3. ශුද්ධ ජොහාන් තුමා 4. ශුද්ධ ජුද් තුමා

06. දෙවියන් වහන්සේ මොසෙසට දර්ශනය වූ ගිනිගත් නොදැවෙන පදුර මගින් සංකේතවත් වනුයේ,
1. දෙවියන් වහන්සේ ගේ වැඩ සිටීමය. 2. දෙවියන් වහන්සේගේ ප්‍රේමයයි.
3. මෝසෙස්ගේ දුර්වලතාවය 4. ඊශ්‍රායෙල් ජනතාවගේ දුක්ඛිත බවය.

07. ඊශ්‍රායෙල් දිවැසිවරුන් ක්‍රමයෙන් අතුරුදහන් වූ යුගයක බිහි වූ බයිබල් ග්‍රන්ථ කාණ්ඩය වනුයේ,
1. ප්‍රඥා සාහිත්‍යය 2. පංච පුස්තකය 3. දිවැසි ග්‍රන්ථ 4. එළිදරව් ග්‍රන්ථය

08. "නුඹට සමාන කෙනෙකු නුඹට පළමුවෙන් සිටියේවත් නුඹට පසුව සිටින්නේ වත් නැතිවන ලෙස තියුණු නැණ නුවණ නුඹට දෙන්නෙමි" දෙවියන් වහන්සේ මෙලෙස පවසන ලද්දේ,
1. සාවුල් රජතුමාටය. 2. දාවිත් රජතුමාටය.
3. සලමෙන් රජතුමාටය. 4. ශෙදකියා රජතුමාටය.

09. පාවා දීමෙන් අනතුරුව උත්තම පූජක මැදුර වෙත රැගෙන ගිය ජේසුස් වහන්සේව පසුදා පහන්වන විට රැගෙන යන ලද ස්ථානය වන්නේ,
1. අන්නාස් වෙත 2. හෙරෝද් වෙත
3. පූදා ශ්‍රේෂ්ඨාධිකරණයට 4. පිලාත් වෙත

10. ජේසුස් වහන්සේගේ පාස්කු අභිරහස සිදු වූ සමයේ හෙරෝද් ඇන්ටිපස්ගේ පාලන ප්‍රදේශය වූයේ,
1. ගලීලය 2. සමාරිය 3. ජුදයාව 4. ඉදුමිය

11. "මාගේ ස්වාමීනි, මාගේ දෙවියනි, නියමිත උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේට ප්‍රබල සාක්ෂි දරණ ලද්දේ,
1. පිලිප් තුමා 2. තෝමස් තුමා 3. ජූඩ් තුමා 4. නතානියෙල් තුමා

12. මනුෂ්‍යයාට දෙවියන් වහන්සේ සූදානම් කර ඇති නව අහස හා නව පොළව හෙවත් ස්වර්ගීය ජීවිතය සඳහා පෙර නිමිත්ත වන්නේ,
1. ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීමය. 2. ක්‍රිස්තුස් වහන්සේගේ මරණයයි.
3. ක්‍රිස්තු උත්ථානයයි. 4. ක්‍රිස්තු ස්වර්ගාරෝහණයයි.

13. "ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේව කුරුසපත් කළ නමුත්, දෙවියන් වහන්සේ ඔවුන් වහන්සේව උත්ථාන කළ බවත් දෙවියන් වහන්සේගේ දකුණු පසෙහි ජේසුස් වහන්සේ වැඩ සිටින බවටත් ප්‍රබල ලෙස සාක්ෂි දැරූ ශ්‍රාවකයා වනුයේ,
1.ශුද්ධ වූ පාවුළු තුමා 2. ශුද්ධ වූ ස්තේපන් මුනිතුමා
4. ශුද්ධ වූ සන්තියාගෝ මුනිතුමා 4. ශුද්ධ වූ පේදුරු තුමා

14. ජුදා ලබ්ධිකයෙක් වූ ශුද්ධ පාවුළුතුමා හෙවත් සාවුල් කිතුණුවන් අත් අඩංගුවට ගැනීමට නායක පූජකයින්ගෙන් අවසරපතක් ගැනීමට යන ලද්දේ,
1. දමස්කයටය. 2. කයිසාරියට 3. බෙයර්ශෙබාවට 4. කපර්ණවුමට

15. ශුද්ධ පාවුළු තුමා තම ධර්මදූත චාරිකා තුනෙහිදීම ගමන් කළ නගර පමණක් ඇතුළත් වරණය වනුයේ,
1. සිලුකීය, සලමිස්, පාපස්, පර්ගා
2. සිරියාවේ අන්තියෝකිය, ඉකෝනිය, ලුස්ත්‍රාව, දර්බය
3. ත්‍රෝවසය, පිලිප්පිය, තෙසලෝනිකය, බෙරියාව
4. ග්‍රීසිය, ත්‍රෝව්‍යය, මිලේත්‍යය, එපීසිය

16. " එහෙත් ඔබ කියන සේක් නම් දැල් හෙළමි"
යනුවෙන් පවසන මොහොතේ පේදුරුතුමා සමග සිටි අනෙක් ශ්‍රාවකයා වන්නේ,
1. ජොහාන් 2. ජාකොබ් 3. ඇන්ඩෘ 4. තෝමස්

17. " ඔබ උදේසා දෙනු ලබන මාගේ ශරීරය මේය. මා සිහි කිරීම පිණිස මෙය කරන්නැයි" උන්වහන්සේ වදාළ සේක. මෙහි ඔබ උදෙසා යන්නෙන් හඟවනු ලබන දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණය වන්නේ,
1. දේව ප්‍රසාද නිධානයක් 2. භෝජනයක් 3. යාගයක් 4. ගිවිසුමක්

18. එකම ක්‍රිස්තුන් වහන්සේව ලබා ගන්නා අප සියලු දෙනා එකම ශරීරයක් වීම. එම එකම "ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය" යනු,
1. ශුද්ධ වූ සභාවයි. 2. දිව්‍ය සත්ප්‍රසාදයයි. 3. දිව්‍ය පූජාවය 4. ප්‍රේමයක්

19. දිව්‍ය සත්ප්‍රසාදීය ප්‍රාතිහාර්යය සිදු වූ ශුද්ධ ලොගොන්ෂියන් මුනිතුමාට කැප කළ දෙව් මැදුර පිහිටා තිබුණේ,
1. අයර්ලන්තය 2. ජර්මනියේ 3. ප්‍රංශයේ 4. ඉතාලියේ

20. ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිත යාගය තුළින් නව ගිවිසුමේ බැටළු පෝතකයාණන් බවට පත්වීම අප සිහිපත් කරනුයේ,
1. ගොබ් ඉරිදාය 2. මහ බ්‍රහස්පතින්දා ය. 3. මහ සිකුරාදා ය. 4. පාස්කු ඉරිදා

21. " මම ඔබට අලුත් ආඥාවක් දෙමි. එකිනෙකාට ප්‍රේම කරන්න. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" ජේසුස් වහන්සේ මෙලෙස පැවසූ අවස්ථාව වනුයේ,
1. පාද දෝවනයේ දීය. 2. උත්තම පූජක යැදුමේ දී ය.
3. මල් උයනේ යැදුමේ දී ය. 4. කුරුස ගසේ දී ය.

22. සුළු පාප කර ඇත්තෙකු දිව්‍ය පූජාවේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට පෙර සූදානම් විය යුතු අවස්ථාව වනුයේ,
1. ආරම්භක පිළිවෙත. 2. පඩුරු පිදීම.
3. පශ්චාත්තාපික පිළිවෙත. 4. දේව වාක්‍ය පිළිවෙත.

23. ඊශ්‍රායෙල් දවන පූජා අතර 'සාම පූජා' යනු
1. සම්පූර්ණයෙන්ම දවන පූජා 2. සහභාගිකමේ පූජා 3. පාප පූජා 4. වන්දි ගෙවීමේ පූජා

24. ඇල්බීනියාවේ උපන් භාග්‍යවන්ත තෙරේසා මව්තුමියගේ බෞතීස්ම නාමය වනුයේ,
1. මාගරීටා 2. ලොරෙට්ටෝ 3. ඇග්නස් 4. මාරියා

25. එඬේරික ජීවිතයක් ගත කළ ද දේව ආශිර්වාදය තුළ 'විශ්වාසයේ පියා' යන විරුදාවලිය ලැබීමට භාග්‍යවන්තයෙකු වූයේ,
1. ආදම් 2. නෝවා 3. ආබ්‍රහම් 4. ජාකොබ්

26. "ඔබේ කඩුව කොපුවේ දමා ගන්න. කඩු ගන්නා සියල්ලෝම කඩුවෙන්ම නසිති" මෙලෙස පවසන ලද්දේ,
1. පේදුරු තුමා 2. ජේසුස් වහන්සේ
3. හෙරෝද් අධිරාජ්‍යයා 4. ස්නාවක ජොහාන් තුමා

27. "නුඹේ සහෝදරයාගේ ලේ පොළවෙන් මට මොරගසයි" මින් මතු නුඹ පොළෝ තලය මත සාප ලද්දෙක් වේවා" ඉහත උපුටනයේ 'නුඹේ සහෝදරයා' ලෙස හඳුන්වනුයේ,
1. කායින් 2. ආබෙල් 3. සෙත් 4. ආදම්

28. A - ධනය ඉපයීම වෙනුවෙන් අන් අය බිලිදීම.
B - මව් කුස සිටින කලලය විනාශ කිරීම හෙවත් ගබ්සාව
C - පාපොච්චාරණයේ දී වැරදි සැඟවීම.
D - සියදිවි නසා ගැනීම හෝ ඊට තැත් කිරීම.
E - එදිනෙදා සිදුවීම් වලදී දෙවියන් වහන්සේට දොස් කීම.
ඉහත කරුණු අතුරින් 5 වන පනතට විරුද්ධ පාපයන් ඇතුළත් වරණය වනුයේ,
1. A, B, C 2. B, C, D 3. B, C. E 4. A, B,D

29. පහත නාම අතුරින් ආදි පීතෘ ජාකොබ්ගේ පුත්‍රයෙකු වන්නේ,
1. ආබ්‍රහම් 2. ඊසාක් 3. ඒසව් 4. ජෝසප්

30. " සෑම කිතුණුවෙක්ම මයාර්‍යාදාව තුළ ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමට පොරොන්දු දෙන සප්‍රමේන්තුව වන්නේ,
1. ප්‍රසාද ස්නාපනය 2. සමඟි සන්ධානය 3. දිව්‍ය සත්ප්‍රසාදය 4. අභිවෘධි ආලේපය

31. පෞද්ගලික දේපල පරිහරණය පිළිබඳ කතෝලික සභා ධර්මෝපදේශයේ ඉගැන්වීමට අනුව ශුද්ධ සභාවේ පාරම්පරික ලක්ෂණයක් වන්නේ,
1. ලෞකිකත්වය සොයා යාම 2. දිළිඳුන්ට ආදරය කිරීම.
3. අධ්‍යාත්මිකත්වය ඉවත දැමීම 4. අසරණයන් තලා පෙළීම

32. අවශ්‍යතාවයෙන් පෙළෙන්නන් හට උදව් උපකාර කිරීම පිළිබඳ අපට ප්‍රබල ලෙස පෙන්වා දෙන්නේ,
1. ශුද්ධ අගුස්තීනු තුමා 2. ශුද්ධ අම්බ්‍රෝස් තුමා
3. ශුද්ධ ජෝන් ක්‍රිසෝස්තම් තුමා 4. ශුද්ධ ජස්ටින් තුමා

33. කිතුණු ජනවන්දනාව තුළ ප්‍රධාන ජනවන්දනා භක්ති අභ්‍යාස ගණන වන්නේ,
1. 2 කි. 2. 3 කි. 3. 4 කි. 4. 5 කි.

34. ආගමන සමය තුළ සමරන වැදගත් මංගල්‍යයක් වනුයේ,
1. මරිය තුමිය ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳගැනීමේ මංගල්‍යය
2. ශුද්ධ පවුලේ මංගල්‍යය
3. දෙවි බිළිඳුන් රජුන්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යය
4. ශ්‍රී ලංකා අප ස්වාමිදුවගේ මංගල්‍යය

35. ජනවන්දනා වර්ෂය තුළ පසුතැවිල්ලෙන් හා ආත්ම පරිත්‍යාගයෙන් ජීවිත වෙනසක් ඇති කර ගැනීමට විශේෂාකාරයෙන් ආරාධනා කරන කාලසීමාව වන්නේ,
1. ආගමන සමය 2. චතාරික සමය 3. නත්තල් සමය 4. පාස්කු සමය

36. ශුද්ධ වූ සතියේ ප්‍රධාන ජනවන්දනා දිනයකි.
1. ගුරු අඟහරුවාදා 2. අළු බදාදා 3. මහ බ්‍රහස්පතින්දා 4. පාස්කු ඉරිදා

37. මළවුන් සඳහා දිව්‍ය පූජාව පවත්වන විට දී භාවිතා කරනු ලබන ජනවන්දනාමය වර්ණය වනුයේ,
1. දම් 2. කොළ 3. රතු 4. සුදු

38. කිතුණු ජනතාව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ තමන්ට අත්වුණු ගැළවීම විශේෂාකාරයෙන් සිහිපත් කරනුයේ,
1. පාස්කු සමයේ දීය. 2. ආගමන සමයේ දීය.
3. සාමාන්‍ය සමයේ දීය. 4. නත්තල් සමයේ දීය.

39. දිව්‍ය පූජාවේ ස්තෝත්‍ර යාගික පිළිවෙතට අයත් කොටසක් වනුයේ,
1. සාධුකාරය 2. සාමය පැතීම 3. ධර්මානුශාසනාව 4. විශ්වාස ලක්ෂණය

40. ජේසුස් වහන්සේ අත් අඩංගුවට ගැනීමට පැමිණි මොහොතේ උත්තම පූජක දාසයෙකු වූ "මල්කුස්" ගේ කණ කපා දමන ලද්දේ,
1. ජේසු තුමා විසිනි. 2. ජුදාස් විසිනි
3. ක්‍රිස්තු ශ්‍රාවකයෙකු විසිනි 4. උත්තම පූජකයා විසිනි.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 14 S II

කතෝලික ධර්මය - II | කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :- ● පළමු වැනි ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
● පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

(01) i. ජනතා ගැටළු දේව වේදිය දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කර ඇති පැරණි ගිවිසුම් ග්‍රන්ථ 2 ක් ලියන්න.
ii. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා කළ කාලය හා ස්ථානය ලියන්න.
iii. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්ස්ව දර්ශනය වූ තනි පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.
iv. බ්‍රිතාන්‍ය යුගය තුළ මෙරට සේවය සඳහා පැමිණි පැවිදි පූජක නිකායන් 2 ක් නම් කරන්න.
v. පූජක මෙල්කිසදෙස් ප්‍රථම වරට පූප හා මිදි යුෂ පූජා කළ නගරය හඳුන්වන නාමයන් 2 ලියන්න.
vi. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් වීමේ ආකාර 02 නම් කරන්න.
vii. එපීස ලිපිය තුළ පාවුළු තුමා දරුවන් ඇති දැඩි කරන්නට පියවරුන්ට පවසන ආකාර 2 ලියන්න.
viii. කිතුනුවා දෙවියන් පිළිබඳ බලාපොරොත්තු වීමට විරුද්ධ පාප 2 ක් ලියන්න.
ix. පාස්කු සමය තුළ ක්‍රිස්තු උත්ථාන මංගල්‍යයට අමතරව සමරනු ලබන මංගලයයන් 2 ක් ලියන්න.
x. දිව්‍ය පූජාවේ ඇතුළුවීමේ පෙරහැරේ ඉදිරියෙන් ම ගමන් කරන පූජා සහයකයින් දෙදෙනා නම් කරන්න.

(02) i. ශුද්ධ පාවුළු තුමාගේ සංදේශ තුළ වූ උපදෙස් වර්ග 2 නම් කරන්න.
ii. ශුද්ධ පාවුළු තුමාගේ ආරූඪ කර්තෘත්වයට අදාළ සංදේශ 3 ක් නම් කරන්න.
iii. මුල් කිතුණු සභාවේ විශිෂ්ඨ ධර්මදූතයෙකු වූ ශුද්ධ පාවුළු තුමා මෙන් දේව වචනයේ සාක්ෂි කරුවෙකු වීමට ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න.

(03) i. ලන්දේසි යුගය තුළ ශ්‍රී ලංකාවේ සේවය කළ ගිහි නායක දෙපිරිසක් නම් කරන්න.
ii. ගෞරවණීය ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා මෙරට කිතුණු සාහිත්‍යය ගොඩ නැංවීමෙහි ලා සේවය කළ අංශ 3 ලියන්න.
iii. " කිසියම් පුද්ගලයෙකු මුළු ජීවිත කාලය තුළදීම නොසළකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටුකර ගත නොහැකිය" යන ජුසේවාස් පියතුමාගේ අවසාන ඔවදනට අනුව ඔබගේ ජීවිතයට ලබාගත හැකි මඟ පෙන්වීම් 5 ක් ලියන්න.

(04) i. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග 2 ක් නම් කරන්න.
ii. ජේසුස් වහන්සේ තම අන්තිම රාත්‍රී භෝජනයේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම පිළිබඳව දක්වන නව ගිවිසුම් කතුවරුන් තිදෙනෙක් නම් කරන්න.
iii. දිව්‍ය පූජාවට අර්ථවත්ව සහභාගී වීමට ඔබ ගන්නා ක්‍රියා මාර්ග 5 ක් ලියන්න.

(05) i. කිතුණු යාච්ඤාව සම්පූර්ණත්වයට පත්වීමට තිබිය යුතු දේව ධර්ම ගුණ 2 ක් ලියන්න.
ii. දිව්‍ය පූජා යාගය සිදුකිරීමේ ප්‍රධාන අරමුණු 3 ක් ලියන්න.
iii. සියලු දෙයට වඩා දෙවියන් වහන්සේට ප්‍රේම කිරීමට දස පනත පළමු පනත් 03 තුළින් ගොඩනංවන සාරධර්ම 5 ක් ලියන්න.

(06) i. දිව්‍ය පූජාවේ පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනු කොටස් 2 ලියන්න.
ii. දිව්‍ය පූජාවේ දක්නට ලැබෙන මුලසුන යැදුම් 3 නම් කරන්න.
iii. "කිතුණු සභා එකමුතුව දේව අභිප්‍රායයි". මෙය කරුණු 5 කින් විස්තර කරන්න.

(07) පහත මාතෘකා අතුරින් 2ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
i. හිබෲ ප්‍රඥාවේ ප්‍රභේද
ii. නිදහස් යුගය තුළ ශ්‍රී ලංකා සභාව
iii. ගරු මයිකල් රුද්‍රිගෝ පියතුමා
iv. පොරොන්දු හා බාරහාර
v. රාජ්‍ය පාලක හා පුරවැසි යුතුකම්

# තෙවන වාර පරීක්ෂණය - 2019

## කතෝලික ධර්මය

10 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 3 | 11 - 2 | 21 - 1 | 31 - 2 |
| 02 - 4 | 12 - 3 | 22 - 3 | 32 - 3 |
| 03 - 1 | 13 - 4 | 23 - 2 | 33 - 2 |
| 04 - 2 | 14 - 1 | 24 - 3 | 34 - 1 |
| 05 - 3 | 15 - 2 | 25 - 3 | 35 - 2 |
| 06 - 1 | 16 - 3 | 26 - 2 | 36 - 3 |
| 07 - 4 | 17 - 3 | 27 - 2 | 37 - 1 |
| 08 - 3 | 18 - 1 | 28 - 4 | 38 - 3 |
| 09 - 3 | 19 - 4 | 29 - 4 | 39 - 2 |
| 10 - 1 | 20 - 3 | 30 - 1 | 40 - 3 |

## II කොටස

(01) i. රූත්, එස්තර්
ii. ක්‍රි.ව. 80-90 / ග්‍රීසියේ අක්කායා
iii. මග්දලාවේ මරියා / තෝමස් අපෝස්තුළුතුමා
iv. සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන/ නිමල මරිය / ජේසු නිකාය.
v. සාලොම් / ජෙරුසෙලම
vi. ආත්මික සූදානම / ශාරීරික සූදානම
vii. අවවාදයෙන්, විනයෙන්
viii. ඉච්ඡාභංගත්වය / අනුමානය
ix. - ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහණ මංගල්‍යය
- පෙන්තකොස්ත (ශුද්ධාත්ම) මංගල්‍ය
x. - සුවඳ දුම් රැගත් පූජා සහයකයා
- ශ්‍රී කුරුසිය රැගත් පූජා සහයකයා

(02) i. දේව ධාර්මික උපදෙස්
එඩේරික උපදෙස්
ii. II තෙසලෝනික , I, II තිමති, තීතස්
iii. 01. පළමුව තමන් දේව වචනය නිසි ලෙස ඉගෙනීම / අසරණ කොන් වූවන්ට උපකාර කිරීම ජීවිතාදර්ශයෙන් සාක්ෂි දැරීම / දහම් පාසලේ හා මීසමේ විවිධ සමිති සමාගම් වල සේවය කිරීම / දේව රාජ්‍යය පතල කිරීමට දායක වීම,ආදි කරුණු ඇත්නම් ලකුණු දෙන්න.

(03) i. අන්නම් / මුහුප්පු / සන්ක්‍රිස්තියන්
ii. ග්‍රන්ථකරණය / නාට්‍ය කලාව / සංගීතය
iii. - අප සැමද මෙලොව ජීවිතය තුළ දී කළ යුතු දේ කල් නොදමා කළ යුතු වේ.
- සැවොම මරණයට පත්වන බැවින් අනන්ත ජීවිතය පිළිබඳ අවදියෙන් සිටිය යුතු බව
- කාලය කළමනාකරණය කළ යුතු බව
- මෙලොව ජීවිතයේ දී අප කරන දෑ අනන්ත ජීවිතයට ඉවහල් වන බව.
- එදිනෙදා ජීවිතය තුළ කළ යුතු දෑ පිළිබඳ පසුතැවිලි වීමට ඉඩ නොතබා යුතුකම් නිසි ලෙස ඉටුකිරීම.
- සතුටුදායක මරණයක් සඳහා සෑම විටම ක්‍රියා කළ යුතු බව.

(04) i. පාස්කු බැටළුවා / නුමුහුම් රොටී / තිත්ත පලා / බැටළුවා

ii ශුද්ධ මාක් තුමා/ ශුද්ධ මතෙව් තුමා / ශුද්ධ ලූක් තුමා/ ශුද්ධ පාවුළු තුමා

iii. (2)

- අප දිව්‍ය පූජාවේ ආරම්භයේ සිට අවසානය දක්වාම රැඳී සිටීම.
- දිව්‍ය පූජාවේ නිවැරදි ඉරියව් පවත්වා ගැනීම.
- ගීතිකා ගායනට හා පිළිතුරු දීම් වලට සහභාගී වීම.
- පඩුරු පිදීම
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම.
- දේව වචනයට ඇහුම්කන් දීම හා ඒ තුළ ජීවත්වීම.
- දේවස්ථානය තුළ අනවශ්‍ය කතා බහෙන් වැළකී සිටීම.

(05) i. විශ්වාසය / බලාපොරොත්තුව / ප්‍රේමය

ii. - දෙවියන් වහන්සේට නමස්කාර කිරීම.
- දෙවියන් වහන්සේට තුති පිදීම .
- පාපවලට වන්දි ගෙවීම.
- ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම.

iii. - මිත්‍යා ඇදහිලි වලින් අපව ඈත් කිරීම.
නිදඃ- යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, හූනියම් ....
- බලසම්පන්න දෙවියන්ගේ දේව බලය මත යැපෙන්නට මඟ පෙන්වීම.
- යාච්ඤාව තුළ ජීවත් වීමට යොමු කරවීම.
- එදිනෙදා මුහුණ දෙන දුක් කරදර ඉවසීමෙන් දරා ගැනීමට ශක්තිය දීම.
- දිව්‍ය පූජාව තුළ දේව වරප්‍රසාදයන් පූර්ණත්වයට පත් කිරීම.
ආදී කරුණු ඇත්නම් ලකුණු දෙන්න.

(06) i. - පඩුරු පෙරහැර හා පඩුරු පිදීම
- පඩුරු මත යැදුම

ii. පොදු යැදුම / පඩුරු මත යැදුම / බොදුනින් පසු යැදුම

iii. - ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කරන ලද්දේ එකම සභාවකි.
- ශුද්ධ සභා බෙදීම් දේව අභිමතය නොවේ.
- ඊට හේතුව මිනිස් දුර්වලකම පාපී බවයි.
- ජේසුස් වහන්සේ උත්තම පූජක යැදුමින් අයැද සිටියේ ද සභා එකත්වයයි.
- ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස සභාව ඊට විවිධ පියවර ගෙන ඇත. ආදී කරුණු අනුව ලකුණු දෙන්න.

(07) i. හිබෲ ප්‍රඥාවේ ප්‍රභේද
- ප්‍රඥාව සඳහා යෙදෙන හිබෲ වචනය හොක්මා
- එහි අර්ථය සාර්ථකව හා ධර්මිෂ්ඨව ජීවත් වීමය.
- ප්‍රඥාවේ ප්‍රභේද 4 කි.
මේවා විස්තර කිරීම 10 ශ්‍රේණියේ පිටු අංක 10,17 විස්තරය අනුව ලකුණු දෙන්න.

ii. නිදහස් යුගය තුළදී ශ්‍රීලංකාවෙ
පිටු අංක 42,43, අනුව ලකුණු දෙන්න.

iii. පිටු අංක 62, 63 අනුව ලකුණු දෙන්න.

iv. පිටු අංක 68 අනුව ලකුණු දෙන්න.

v. පිටු අංක 79, 80 අනුව ලකුණු දෙන්න.